# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/7 - 2020 ජූලි මස 27 වැනි සඳුදා - 2020.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විශේෂ නිවේදනය

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමෙහි ඡන්ද ගණනය කිරීමට අදාළව සහ තරග කරනු ලබන එක් එක් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයන් පත්කිරීමට අදාළව 2020.07.17 දින පැවති පක්ෂ ලේකම්වරුන්ගේ රැස්වීමේදී පාලිත COVID - 19 නව සාමාන්‍ය තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පළ කරන ලද එකඟත්වය සඳහා පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලද බව.

1. 2020.08.05 දින පැවැත්වෙන ඡන්ද විමසීමේදී ඡන්ද ගණන් කිරීම, බලයලත් නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් නිසි ලෙස දැනුවත් කර 2020 අගොස්තු 06 දින පෙරවරු 7.00 ට හෝ 8.00 ට ආරම්භ කරනු ඇති බව ;

2. 2020.08.05 දින ඡන්ද පෙට්ටි ආපසු භාරගැනීම නිරීක්ෂණය සඳහා එක් භාරගැනීමේ ශාලාවක් සඳහා එක් පක්ෂයකින් හෝ කණ්ඩායමකින් නියෝජිතයන් දෙදෙනෙකු පත්කළ හැකි බව ;

3. 2020.08.05 දින රාත්‍රී කාලයේ ගණන් කිරීමේ පරිශ්‍රයේ රැඳී සිටීම සඳහා එක් ඡන්ද ප්‍රදේශයක් සඳහා එක් පක්ෂයකින් හෝ කණ්ඩායමකින් නියෝජිතයන් දෙදෙනෙකු පත්කළ හැකි බව ;

4. ගණන් කිරීමේ පළමුවන අදියර (එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම), දෙවන අදියර (පක්ෂ/ කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම) සහ තුන්වන අදියර (මනාප ගණන් කිරීම) නිරීක්ෂණය සඳහා එක් එක් මැතිවරණ කොට්ඨාසවල සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවක් සඳහා එක් පක්ෂයකින් හෝ කණ්ඩායමකින් උපලේඛනයේ දක්වා ඇති පරිදි නියෝජිතයන් පත්කළ හැකි බව ;

5. තුන්වන අදියරේදී එක් එක් ගණන් කිරීමේ ශාලාවේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂයේ/ කණ්ඩායමේ මනාප ගණන් කිරීම ආරම්භ කරනු ලබන බවත්, මනාප ගණන් කරනු ලබන පක්ෂයේ/ කණ්ඩායමේ ගණන් කිරීමේ නියෝජිතයන් පමණක් එම අවස්ථාවේ රැඳී සිටීමට අවසර දෙනු ලබන බවත් ;

6. ඉන් ඉක්බිතිව මනාප ගණන් කරනු ලබන පක්ෂයේ/ කණ්ඩායමේ නියෝජිතයන් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරින්ගේ දැනුම් දීම අනුව ශාලාවට පිවිසිය හැකි බව ;


1A - PG 005071 — 267 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයෙකු තේරී පත්වී නොමැති නම් මනාප ගණන් කරනු නොලබන බවත්, තේරීම්භාර නිලධාරි විසින් මන්ත්‍රීධුර හිමි පක්ෂ/ කණ්ඩායම් ප්‍රකාශයට පත්කළ පසු මන්ත්‍රීධුර හිමි නොවූ සියලුම පක්ෂ/ කණ්ඩායම්වල නියෝජිතයන් ගණන් කිරීමේ පරිශ්‍රයෙන් ඉවත් විය යුතු බව.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මහින්ද දේශප්‍රිය,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එන්. ජේ. අබේසේකර,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**එස්. රත්නජීවන් එච්. හූල්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2020 ජූලි මස 26 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| මැතිවරණ කොට්ඨාසයේ අංකය | මැතිවරණ කොට්ඨාසය | අපේක්ෂකයින් ගණන | සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ ශාලාවක් සඳහා පත්කළ හැකි නියෝජිතයන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | 1 වන සහ 2 වන අදියර සඳහා | 3 වන අදියර සඳහා (අමතරව) | 3 වන අදියර සඳහා පත්කළ හැකි උපරිම නියෝජිත සංඛ්‍යාව(1 සහ 2 අදියර නියෝජිතයින් ඇතුළත්ව) |
| 1 | කොළඹ | 22 | 03 | 09 | 12 |
| 2 | ගම්පහ | 21 | 03 | 09 | 12 |
| 3 | කළුතර | 13 | 03 | 09 | 12 |
| 4 | මහනුවර | 15 | 03 | 09 | 12 |
| 5 | මාතලේ | 08 | 03 | 05 | 08 |
| 6 | නුවරඑළිය | 11 | 03 | 08 | 11 |
| 7 | ගාල්ල | 12 | 03 | 09 | 12 |
| 8 | මාතර | 10 | 03 | 07 | 10 |
| 9 | හම්බන්තොට | 10 | 03 | 07 | 10 |
| 10 | යාපනය | 10 | 03 | 07 | 10 |
| 11 | වන්නි | 09 | 03 | 06 | 09 |
| 12 | මඩකලපුව | 08 | 03 | 05 | 08 |
| 13 | දිගාමඩුල්ල | 10 | 03 | 07 | 10 |
| 14 | ත්‍රිකුණාමලය | 07 | 03 | 04 | 07 |
| 15 | කුරුණෑගල | 18 | 03 | 09 | 12 |
| 16 | පුත්තලම | 11 | 03 | 08 | 11 |
| 17 | අනුරාධපුරය | 12 | 03 | 09 | 12 |
| 18 | පොළොන්නරුව | 08 | 03 | 05 | 08 |
| 19 | බදුල්ල | 12 | 03 | 09 | 12 |
| 20 | මොණරාගල | 09 | 03 | 06 | 09 |
| 21 | රත්නපුර | 14 | 03 | 09 | 12 |
| 22 | කෑගල්ල | 12 | 03 | 09 | 12 |

* 1 වන අදියර - එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම.
* 2 වන අදියර - එක් එක් පක්ෂය හා කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම.
* 3 වන අදියර - මනාප ගණන් කිරීමේ අදියර.

08 - 181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.